Page 4 October 2012.qxd 24/10/2012 09:03 Page 1

1 වන පිටුවෙන්.....

රට හදමු.....!

ඊළඟට රජය අතගැසූ තවත් පියවරක් නම් ජනාධිපති ලේකම් වරයාගේ ප්‍රධානත්ව යෙන් පත්කරන ලද අට දෙනෙකුගෙන් සමන්විත උගත්පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසම ට පැවරූ වගකීමයි. එය සැබැවින්ම දීර්ඝ යුද්ධයකින් පීඩනයට පත් රටක් යථා තත්වයට ගෙන ඒම පිණිස විසඳුම් සොයා යෑමේ අවංක පියවරක් වහයෙන් සැලකිය හැකි වෙයි.

මානව හිමිකම් කොමිසම පවත්වන්නට යන සිව් වසර විමසුම මගින් ඔවුන්ට අපට කළහැකි දෙයක් නැත. එසේ වුවද අප ගෙන ඇති ඉහතින් සඳහන් කළ ශුභවාදී පියවරවල් මානව හිමිකම් කොමිසමේ වාර්තාවී තිබිය යුතුය. එමගින් ශ්‍රීලංකාවේ සතුරන් අනාගතයේ තවත් චෝදනාවන් ගෙනෙනු වළකාගත හැකි වනු ඇත.

බ්ලේක් යළිත් උතුරු නැගණිහිර හොල්මන් කරයි

එල්ටීටීඊ යේ පරණ යාළුවා වන රොබර්ට් බ්ලේක් මතකද? ඔහු කලක් ශ්‍රීලංකාවේ සහ මාලදිවයිනේ ඇමරිකානු තානාපතිවරයාව සිටියේය. එසේම එකල ඔහු කොටින්ට උදව්කරන්නට තැත්කළ අවස්ථා කීපයකදීම ඔහු ලංකා ජනතාවගේ කෝපයට සහ අවඥාවට භාජනය වුණේය. රොබර්ට් බ්ලේක් ඇමරිකානු රජයේ ආසියානු කටයුතු භාර නියෝජ්‍ය මහලේකම්වරයා වශයෙන් දැන් කටයුතු කරයි.

මේ නොබෝදා ඔහු ලංකාවට ඇවිත් වටයක් කරකැවී රවුල් හකීම් මුණගැසී ඇත. ඒ මේ ළඟදී නැගණිහිර පැවති පළාත් සභා ඡන්දයෙන් එක්සත් ජනතා නිදහස් සංධානයට බලය හිමිවූවාට පසුවය. මෙහිදී දුවිඩ සන්ධානය රවුල් හකීම් ප්‍රමුඛ මුස්ලිම් පක්ෂ සමග එක්වී පෙරමුණක් සාදාගන්නට තැත්කළ අවස්ථාවේ රජය ඥාණාන්විතව ක්‍රියාකරමින් තමන්ට බලය හිමි නැගණිහිර පළාත් සභාවේ මහ ඇමති ධුරය මුස්ලිම් අයට පිරිනැමුවාය. එසේ නොකළේ නම් දුවිඩ සංධානය තැත්කළේ මුස්ලිම් අයත් දෙමළ බස කතාකරන නිසා මුස්ලිමුන් හා සමග එකතුව උතුරු නැගණිහිර සිටින්නේ දෙමළ බස කතාකරන බහුතර ජනතාවක් බවත්, ඒ නිසා ඒ පළාත් දෙක ආදා ජේ. ආර්. සමයේ කළාක් මෙන් එක පළාතක් කරගැන්මටය. එය කරගත් විට ඔවුන්ගේ ඊළඟ පියවර වනු ඇත්තේ එයට ස්වයං තීරණ අයිතිය අවශ්‍යය කියා යළිත් උද්ඝෝෂණ ව්‍යාපාර පටන්ගන්නටය. ඒ ක්‍රමය නැවතත් අර පරණ ඊළම් ඉල්ලන තත්වයට ගෙන එන්නටය. රොබර්ට් බේලේක් හදිසියේ පැමිණ හකීම් මුණ ගැසුණේ ඇයි? දුවිඩ සංධානය සමහර විට ඔහුට සිය අවශ්‍යතාව කියන්නට ඇත.

මේ සියල්ලෙන් අපට පැහැදිලි වන එක දෙයක් තිබේ. එනම් තවමත් රට දෙකඩ කරගන්නට අපේ සතුරන් සියළු උප්පර වැට්ටි යොදමින්, සුදානමින්, ඇහි පිල්ලන් නොගසා බලා සිටින බවය. එනිසා අප ඇස් කන් හොඳින් විවෘතව තබාගනිමින් සුපරීක්ෂාකාරීව සිටිය යුතුය.

දිවි නැගුම වැඩපිළිවෙල

මේ වනාහි රජය යුද්ධයෙන් පසු ජනතා ශුභ සිද්ධිය පිණිස මෑතදී ආරම්භකළ සංවර්ධන වැඩපිළිවෙලකි. මෙමගින් මිලියනයක නිවැසියන් වෙනුවෙන් ආර්ථික සහන සැළසෙන අතර මෙය ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ මූලිකත්වය ගෙන ඇත.

මේ සඳහා දිස්ත්‍රික් ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමේ විශේෂ කොමිටි නිර්මාණය කර ඒවා අතර සම්බන්ධීකරණය තුළින් වැඩ පිළිලෙ ක්‍රියාත්මක කරන්නට කටයුතු යොදා තිබේ. මේ පිළිබඳ සොයැබැලීම අමාත්‍යාංශ කීපයක සහ රජයේ දෙපාර්තමේන්තු කීපයක මැදිහත්වීමෙන් සිදුකෙරේ. එමගින් අවශ්‍ය කඩිනම් ප්‍රතිඵල ලැබිය හැකි බව රජයේ විශ්වාසයයි.

අද රටේ ආර්ථික සංවර්ධනය විවිධ අධිකාරී යටතේ ක්‍රියාත්මක වෙයි. ඒවා සමෘධි අධිකාරිය උඩරට සංවර්ධන අධිකාරිය ප්‍රාදේශීය සංවර්ධන අධිකාරිය පොල් සංවර්ධන අධිකාරිය ආදී විවිධ නමීවලින් යුක්තය. රජය මේ සියල්ල ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතට ගෙනැවිත් ඇත. එමගින් ඒ සියල්ල වඩාත් හොඳින් සමායෝජනය (co-ordinate) කර ඉන් කාර්යක්ෂම ලෙස ප්‍රතිඵල ලබාගැන්මට රජය බලාපොරොත්තු වෙයි.

සංවර්ධනයට ඇති බාධක

මේ අවස්ථාවේ නීතිමය වශයෙන් මතුවූ යම් යම් බාධක නිසා සංවර්ධනය සඳහා යම් යම් ක්‍රියා මාර්ග ගැනීමේදී පළාත් සභාවල අනුමැතිය ලබාගන්නට සිදුවෙයි. පළාත් සභා ව්‍යවස්ථාවට අනුව යම් පියවරවල් සඳහා සියළුම පළාත් සභාවල අනුමැතිය තිබිය යුතුය. නිදසුනක් වශයෙන් උතුරු පළාතට සභාවක් තවම පත්වී නැත. ඒ පළාතේ සංවර්ධනයට අදාළ පනතක් සම්මත කර ගැන්මට ඒ නිසා උතුරු පළාතේ ආණ්ඩුකාරයා සිය අනුමැතිය දුන්නේය.මේ බව ඇසූ යාපනයේ දුවිඩ සන්ධාන මන්ත්‍රීවරයා අනුමැතියක් දෙන්නට ආණ්ඩු කාරයාට බලයක් නැතැයි ද ඒ නිසා පනත වළංගු නැතැයිද කියා ඉහළ උසාවියේ නඩුවක් පැවරීය. එක්සත් ජාතික පක්ෂය ද එයම කියා පනතට විරුද්ධ වීය.

බෙදුම්වාදීන්ගේ උපායයන්

ශ්‍රීලංකා රජය උතුරේ ගෙන යන සංවර්ධන වැඩ පිළිවෙලට අකුල් හෙළීම දුවිඩ බෙදුම්වාදීන්ගේ එක් උපායකි. එසේ කරන්නේ ඔවුන් ගෙන යන වෙනම රාජ්‍යයක් ඉල්ලීමට එම සංවර්ධන වැඩ හරස්වන බැවිනි. සංවර්ධනය සිදුවන විට උතුරේ ජනතාව එය අගයනවා මිස බෙදුම්වාදීන්ගේ බහට අවනත නොවේ. එසේම උතුරේ සීඝ්‍රයෙන් කෙරෙන සංවර්ධන වැඩපිළිවෙල මත බෙදුම්වාදීන් ඉන්දියාව සමග එක්වී දැන් ගෙන යන 13 වන සංශෝධනය මගින් උතුරේ ඉඩම් හා පොලිස් බලතල ලබාගැන්මට ගන්නා උත්සාහය ද නිෂ්ඵල එකක් වන්නේය. මක්නිසාද උතුරේ ජනතාවට බිම් වගාකර සිය ජීවනෝපාය සළසා ගැන්මට ඉඩම් ලැබුණොත් දුවිඩ සංධානය ඇතුළු බෙදුම්වාදීන්ට ඔවුන්ගේ අරමුණු සාර්ථක කරගන්නට ඉඩක් නොලැබේ. මුන් සංවර්ධනය කඩාකප්පල් කරන්නට මහන්සි ගන්නේ එබැවිනි. මේ නිසා සියළු දේශ ප්‍රේමීන් රජය ගෙන යන මෙම සංවර්ධන වැඩපිළිවෙලට හැකි හැම සහායක්ම දිය යුතුව තිබේ. රජය මේ සියළු බාධක මැඩ ඉදිරියට පියවර තබනවා ඇතැයි සිතමු.

රට හැදීම සහ එයට ඇති බාධක

මෙතෙක් ඉහත දක්වනලද කරුණු කාරණා සියල්ලම රටේ සංවර්ධන වැඩපිළිවෙලවල් බව සැබෑය. ඒවායින් ප්‍රතිඵල ලැබිය හැකි බවත් දනිමු. රජය බාහිර සතුරන් ජයගෙන යන ගමන යන්නට සූදානම්වන ගමන්ම යළිත් ඒ උත්සාහයන් බිංදුවට වැටෙන ක්‍රියාවන්ද රජයේම ඇතැම් අයගෙන් සිදුවන හැටි හොඳින් පෙනේ. එය හෝද හෝදා මඩේ දානවා වැනි වැඩකි.

උදාහරණයක් වශයෙන් දැක්විය හැක්කේ මේ නොබෝදා ඇමති මර්වින් සිල්වා සහ ඔහුගේ අකීකරු පුත්‍රයා සම්බන්ධව දක්නට ලැබුණු අශෝභන ක්‍රියාවලියයි. එවැනි හැසිරීම් ලොව වෙන කිසිදු රටක මැති ඇමතිවරුන් ගෙන් හෝ උන්ගේ දරුවන් ගෙන් සිදු නොවේ. මේ දේවල් ලංකා ආණ්ඩුව අපකීර්තියට පත්කරන ගමන්ම ආණ්ඩුවේ සතුරන්ට ජාත්‍යන්තරයට කියාපාන්නට අවශ්‍ය කාරණා මනාව සපයා දෙන්නේය. මේ කිසිවක් වර්තමාන රජයේ යහපත සඳහා නම් නොවේ. මෙවැනි දේ තව තවත් සිදුවන අතරේ ලෝක යෙන් එන අපවාද නැති කරන්නට පිටරටවල් වල සිටින සිංහළ ජනතාව ලවා උද්ඝෝෂණ කරවා කිසි වැඩක් වෙන්නේ නැත.

පරාභවය

අප දන්නා තරමින් ලංකාව උගතුන්, බහුශ්‍රැතයින්, පඬිවරුන්, විද්වතුන් හා සාහිත්‍යධරයින් බිහිවූ රටකි දැනුදු සාක්ෂරතාවෙන් එය බොහෝ රටවලට වඩා ඉහළින් සිටී. එහෙත් අද ශ්‍රීලංකාවේ අධ්‍යාපනය පාසැලේ පහළ බාලාංශයේ සිට විශ්වවිද්‍යාල මට්ටම දක්වාම පවතින්නේ අතිශය අවුල් සහගත තත්වයකය. ගුරු ශිෂ්‍ය දෙපිරිසේම විනය හික්මීම අන්තයටම පිරිහී ඇත. ඒවාට පිළියම් ඇති බවක්ද නොපෙනේ. රටක අධ්‍යාපනය විනාශවී යාම කෙළින්ම ඒ රටම විනාශය කරා යොමුකිරීමකි. රටක් හදනවාය කියන්නේ ආර්ථිකය හැදීම පමණක් නොවේ. ශිෂ්ඨත්වය ආචාර ධර්ම හා සමාජ වටිනාකම්ද ඒ රටේ උපරිම ලෙස නගා සිටුවීමයි. ශ්‍රීලංකාව මේ යන්නේ කන්ද පහළට ගමනක් බව බොහෝ දෙනාට දැන් වැටහී ඇත. එහෙත් මේ බව එහි පාලකයන්ට නොවැටහීම මහා අවාසනාවකි.

ශ්‍රීලංකා නිදහස් අධ්‍යාපනයේ කන්නන්ගර සලකුණ

♦ මේජර් වී. බී. කරුණාරත්න විසිනි



ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා

දේ ශයක ජාතියක පැවැත්ම රඳාපවතින සාධකයන් අතර අධ්‍යාපනය මූලික තැනක් ගනී. ලොව සෑම රටක්ම පාහේ තම දේශපාලන, ආර්ථික හා සාමාජීය ක්‍රියාදාම යන්හි අධ්‍යාපනයට ප්‍රමුඛතාව දී ඇත. සෑම කෙනෙකුටම අධ්‍යාපනය ලැබීම බාධාවක් නොවිය යුතු අතර, අධ්‍යාපනය ලබාගැන්ම මූලික මිනිස් අයිතිවාසිකමක් ද වෙයි. මේ නිසා ලොව සෑම රටක්ම ස්වකීය ජනතාවට අධ්‍යාපන පහසුකම් ලබාදීමට උත්සුක වෙයි. අධ්‍යාපනය නොමිළයේම දිය හැකි නම් එය උපරිම දිරිගැන්වීමකි.

1884 ඔක්තෝබර් මස 13 වන දින අම්බලංගොඩ රන් දොඹේ නම් ග්‍රාමයේ සාමාන්‍ය පවුලක උපත ලද ක්‍රිස්ටෝපර් විලියම් විරේකෝන් කන්නන්ගර මහතා ගමේ පාසැලෙන් මූලික අධ්‍යාපනය ලැබීය. ඉගෙනීමට ඔහුගේ තිබූ දක්ෂතාව නිසාම ශිෂ්‍යත්වයක් දිනාගෙන එකල ගාල්ලේ උසස් මිෂනාරි පාසැලක් වූ රිච්මන්ඩ් විද්‍යාලයට ඇතුළත් වූයේ ය. පාසැල් අධ්‍යාපනයෙන් පසු නීතිඥ වරයෙකු ලෙස කටයුතු කළ කන්නන්ගර තරුණයා එකල ශ්‍රීලංකාවේ ඇවිලී තිබුණු ලංකාවට නිදහස ලබාගැන්ම සඳහා වූ නිදහස් සටනට හවුල් වෙමින් ලංකා දේශපාලනයට පිවිසියේය. 1923 දී ප්‍රථමයෙන් ව්‍යවස්ථා දායක මන්ත්‍රණ සභාවට ද, පසුව රාජ්‍ය මන්ත්‍රණ සභාවටද පත්වූයේය. එසේම ඒ මහතා ලංකා ජාතික සංගමයේ සභාපතිවරයා වශයෙන්ද කටයුතු කළේ ය.

ශ්‍රීලංකාවේ නිදහස් අධ්‍යාපන බීජ වැපිරුණේ 1936 - 1948 කාල වකවානුවේය. එවකට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් පත්ව සිටියේ ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතා ය. එදා කන්නන්ගර මහතා 1939 අංක 31 දරණ අධ්‍යාපන ආඥා පණත ඉදිරිපත් කරමින් නිදහස් අධ්‍යාපන ක්‍රමය රටට හඳුන්වා දුන්නේය. ඒ නිසාම එතුමා " නිදහස් අධ්‍යාපනයේ පියා" යන විරුදාවලියෙන් එවක් පටන් හැඳින්විණ. එදා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිටි දේශ මාමක දේශපාලනඥයෝ කන්නන්ගර මහතාට සහාය වූහ.

" අධ්‍යාපනය ලබාගැන්මට මා කුඩා කළ විදි දුක්ගැහැට මතු පරපුරේ ළමයින්ට විඳිමට ඉඩ නොතබමි " යනුවෙන් එතුමා පවසා තිබුණේය. එවකටත් පැතිර පැවති ආගමික නිකායන්ට අයත් අධ්‍යාපනය දේශීය නිදහස් චින්තනයකට යොමුකරමින් මධ්‍ය විද්‍යාල 54 ක් මුළු දිවයිනම ආවරණය වන පරිදි ආරම්භ කරමින්, තමා විසින්ම තෝරාගන්නා ලද විදුහල් පතිවරුන්ට පාලනය බාර දෙමින් කන්නන්ගර මැතිතුමෝ එසේ නිදහස් අධ්‍යාපනය අප රටේ උදාකළහ. එමගින් එවකට අධිරාජ්‍ය ගැතිව පැවති අධ්‍යාපනය දේශීය මුහුණුවරක් ගත්තේ ය. පාසැල් යෑම සිහිනයක්ව තිබූ දරුවන්ට පාසැල් දොරටු විවෘතවිය. නගරයේත් ගමේත් එක ලෙස අධ්‍යාපනය පැතිරී ගියේය. දක්ෂතාව ඇති සිසුනට ශිෂ්‍යත්ව පිරිනැමිණ. සමාජයේ හික්මීමත්, විනයත් ඇතිවිය. ඈත ගම්බද පවා සුදුවතින් සැරසී පාසැල් යන ළමා පරපුරක් පාරේ තොටේ දකින්නට ලැබිණ. ක්‍රීඩා, කලාව, සාහිත්‍යය පාසැල් තුළින් එළිදුටුවේය. කෙටිකතා, නවකතා, නාට්‍යය, සිනමාව හා සංගීතය ආදී අංශයන්ට දේශීය මුහුණුවරක් ලැබිණ. පසු කාලීනව වෙනත් නායකයෝද වරින්වර විවිධ අංග නිදහස් අධ්‍යාපනයට එකතු කළෝ ය. විද්‍යාව, ස්වභාෂාවෙන් ඉගැන්වීම, දිළිඳු ළමුනට නේවාසිකා ගාර පහසුකම් ලබාදීම, නොමිළේ පොත්පත්, පාසැල් නිලඇඳුම් හා දිවා ආහාර සැපයීම ද ඒවා අතර විය.



කන්නන්ගරමහතා වෙනුවෙන් ශ්‍රීලංකාවේ නිකුත්කරන ලද තැපැල් මුද්දරය

නිදහස් අධ්‍යාපනයේ ඵල නෙලාගැන්මට සිසුපරපුර සමත්වූහ. 1970 වනවිට ශ්‍රීලංකා පරිපාලන සේවයේ 78% ක්ම මධ්‍ය විද්‍යාල වලින් බිහිවූ දරුවන්ට හිමි විය. ඉන්ජිනේරු, වෛද්‍ය, ගණකාධිකරණය, සන්නද්ධ හමුදා, විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලය ආදී තන්හි නිදහස් අධ්‍යාපනයෙන් බිහිවූ දරුවෝ පත්වූහ.

විශ්වවිද්‍යාල, මධ්‍යවිද්‍යාල, කාර්මික විද්‍යාල ආදී පීඨයන්හි ඉගෙන ගන්නා දරු වන්ගේ ක්‍රියාකලාපය තුළින්ම යහපත් පුරවැසියන්, රාජ්‍ය නිලධාරීන්, සාහිත්‍ය ධරයන්, නිර්මාණ ශිල්පීන් මෙන්ම විවිධ උගතුන් පහළවීමේ පෙරනිමිති දක්නට තිබිණ. ඒ එදා ය. එහෙත් අද තත්වය ?

අද අධ්‍යාපන ක්ෂෙත්‍රය තුළ එවැනි ලක්ෂණ දැකිය නොහැකිය. දහස් ගණනින් අවුල් වියවුල් ගොඩගැසී ඇත. විශ්වවිද්‍යාල වසාදමා ඇත. ආචාර්යවරු, මහාචාර්යවරු,